01) පසුගිය මාස කිහිපය තුළ ලොව පුරා සිදු වූ කොරෝනා වෛරස රෝගය නිසා නිර්මාණශීලී ව්‍යාපාරිකයින්ට,

1.ව්‍යාපාරික අවස්ථා බිහිවිය.
2.ව්‍යාපාරයක බාහිර සාධක පමණක් වෙනස් නොවීය.
3.ව්‍යාපාර සඳහා බලපෑමක් නොවීය.
4.ව්‍යාපාරිකයින්ගේ ශක්තීන් හා දුර්වලතාවලට පමණක් බලපෑමක් සිදුවිය.

02) පහත වැකි අතුරින් වඩා නිවැරදි වාක්‍ය වනුයේ,

1.බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ මහා පරිමාණ ව්‍යාපාර තුළිනි.
2.මහා පරිමාණ ව්‍යාපාර බොහොමයකගේ ව්‍යාපාර කටයුතු ග්‍රාමීය ප්‍රදේශවලට සීමා වී ඇත.
3.බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාර වේ.
4.වෙළෙඳපල හිඩැස යනු ව්‍යාපාරිකයින් විසින් දැනටමත් සපුරාගෙන ඇති වෙළෙඳපල කොටස වේ.

03) නිෂ්පාදන සැලසුමක ඇතුළත් තොරතුරක් වන්නේ,

1.නිමැවුම
2.නිෂ්පාදන ක්‍රියාවලිය
3.නිෂ්පාදන පිරිවැය
4.ඒකක පිරිවැය

04) යම් නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම සඳහා ද්‍රව්‍ය,ශ්‍රමය හා වෙනත් වියදම් වෙනුවෙන් දරන පිරිවැයවල එකතුව වනුයේ,

1.අලෙවි ආදායම
2.අලෙවි වියදම
3.නිෂ්පාදන පිරිවැය
4.අමුද්‍රව්‍ය පිරිවැය

05) කිසියම් අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කරනු ලබන ලේඛනය,

1.ව්‍යාපාර සැලැස්මයි.
2.පරිපාලන සැලැස්මයි.
3.නිෂ්පාදන සැලැස්මයි.
4.මූල්‍ය සැලැස්මයි.